සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන**

**කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2019(II)**

| | | |
|---|---|---|
| **කාලය: පැය 03** | **පරිපාලනය (02-IV)** | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>.................................... |

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

1. i. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත බලය පැවරී ඇති පත්කිරීම් ආකාර මොනවාද? (ලකුණු 03)

   ii. පත්වීමක් පෙරදාතම් කිරීම ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථා මොනවාද? (ලකුණු 04)

   iii. කාර්යක්ෂමතා කඩඉම් පිළිබඳව විධිවිධාන හැරුණු කොට සේවා ව්‍යවස්ථාවක ඇතුළත් කළයුතු වෙනත් අනිවාර්ය කරුණු මොනවාද? (ලකුණු 05)

   iv. සේවා ව්‍යවස්ථාවක ඇතුළත් යම් වගන්තියක් හෝ කොන්දේසියක් සංශෝධනයක් කිරීම සඳහා වන ක්‍රමවේදය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

   v. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත කාලසීමාවේදී සම්පූර්ණ කිරීමට අපොහොසත් වී ඇති නිලධාරියෙක් සම්බන්ධව ගත හැකි ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

2. i. විදේශ ශිෂ්‍යත්වයක් මගින් පශ්චාත් උපාධියක් හැදෑරීම සඳහා වැටුප් සහිත නිවාඩු ලබාදීම පිළිබඳ ක්‍රමවේදය කුමක්ද? එය අනුමත කළයුතු බලධරයා කවුද? (ලකුණු 02)

   ii. වැටුප් සහිත නිවාඩු ලබා විදේශගත වන නිලධාරියෙකු නැවත ශ්‍රී ලංකාවට පැමිණි පසු අනිවාර්ය සේවා කාලයක් සේවය කළ යුතුය. අදාළ අනිවාර්ය සේවා කාලය ගණනය කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

   iii. ආයතන සංග්‍රහය මගින් පනවා ඇති විධිවිධාන අනුව විදේශ නිවාඩු අයදුම් කිරීමේදී අත්සන් තබන ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකළහොත් "අභ්‍යාසය සඳහා දරන ලද වියදම්" නැවත ගෙවිය යුතු බවට කොන්දේසියක් පනවා ඇත. මෙහි අභ්‍යාසය සඳහා දරන ලද වියදම යන්න පැහැදිලි කරන්න. (ලකුණු 05)

   iv. අනිවාර්ය නිවාඩු යන්නෙන් කුමක් අදහස් කරන්නේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

   v. රාජකාරියේ නිරතව සිටියදී හදිසි අනතුරකට ලක් වන නිලධරයෙකු සඳහා නිවාඩු ලබාදිය හැකි අවස්ථා මොනවාද? (ලකුණු 05)

3. i. තවමත් පරිවාස කාලය සම්පූර්ණ කර නොමැති නව පත්වීමක් ලබා ඇති නිලධාරිනියකට ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි ප්‍රසූති නිවාඩු ලබාගත නොහැකි බවට අදහසක් ඉදිරිපත් වී ඇත. මෙම අදහස පිළිබඳ ඔබගේ නිරීක්ෂණය පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii. ඇය ගර්භනී තත්ත්වයේ සිටින බැවින් රාජකාරියට වාර්තා කිරීමේ හා පිටවීමේ වේලාවන් පිළිබඳව සහනයක් ලබාගත හැකි බව රජයේ නිලධරයෙකු වන ඇයගේ ස්වාමිපුරුෂයා සඳහන් කර ඇත. එසේ සහනයක් ලබාදිය හැකි ද? එසේ නම් එයට අදාළ විධිවිධාන පැහැදිලි කර දෙන්න. (ලකුණු 04)

iii. ඇයගේ ස්වාමිපුරුෂයා ද රජයේ නිලධරයෙකු බැවින්, ඔහුට පීතෘත්ව නිවාඩුව ලබාගත හැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

iv. රාජකාරි ආවරණය කිරීම යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)

4. i. අර්ධ රාජ්‍ය ආයතනයන් සඳහා සම්පත්දායකත්වයක් ලබාදීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන පැහැදිලි කරන්න. (ලකුණු 07)

ii. විශ්වවිද්‍යාලයක ඉරිදා දිනවල පැවැත්වෙන පශ්චාත් උපාධි පාඨමාලාවක් සඳහා බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස සම්බන්ධ වන රජයේ නිලධාරියෙකුට ගාස්තු ලබාගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. නිලධරයෙකුට අතිකාල දීමනා ලබාදිය හැකි අවස්ථා මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. අතිකාල ගෙවීම සඳහා අදාළ කරගත යුතු කාල සීමා මොනවාදැයි සඳහන් කරන්න. (ලකුණු 04)

5. ඔබ කාර්යාලයේ සේවය කරනු ලබන ආර්ය මහතා දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධාරියෙකි. වෘත්තීය සමිති ක්‍රියාකාරකම් හරහා ක්‍රියාකාරී දේශපාලන සම්බන්ධතා ගොඩනගාගෙන ඇති ඔහු ඉදිරියේදී පැවැත්වීමට නියමිත පළාත් සභා මැතිවරණය සඳහා තරග කිරීමට අපේක්ෂාවෙන් සිටියි.

i. දේශපාලන හිමිකම් අහිමි නිලධරයන් කවුරුන්ද? (ලකුණු 04)

ii. දේශපාලන හිමිකම් සහිත නිලධරයන් සඳහා හිමි වරප්‍රසාද මොනවාද? (ලකුණු 03)

iii. මැතිවරණයට තරග කිරීමට අපේක්ෂා කරන්නේ නම් ආර්ය මහතා නිවාඩු ලබාගත යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 03)

iv. ආර්ය මහතා එකම සේවා ස්ථානයේ වසර ගණනක් සේවය කිරීම හේතුවෙන් වාර්ෂික ස්ථාන මාරු කිරීම් මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක් අනුව වෙනත් කාර්යාලයක් වෙත මාරු කර ඇත. තමා ක්‍රියාකාරී දේශපාලන පක්ෂයක සාමාජිකයෙකු බැවින්, ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව ස්ථානමාරු කිරීම වැරැද්දක් බව ප්‍රකාශ කරයි. ඔහුගේ ප්‍රකාශය පිළිබඳව ඔබගේ නිරීක්ෂණ හා නිගමනය කුමක්ද? (ලකුණු 05)

v. පළාත් පාලන ආයතනයක සභිකයෙකු වශයෙන් තේරී පත්වූ නිලධරයෙකු සඳහා ලබාදිය හැකි අනුග්‍රහය විස්තර කරන්න. (ලකුණු 05)

6. ඔබගේ ආයතනයේ ද්විතීය මට්ටමේ තනතුරක් සඳහා අලුතින් පත්ව ආ නිලධාරියෙකු වන ගිහාන් මහතා මීට පෙර රජයේ සේවයේ රාජකාරි කොට නොමැත. පත්වීම් ලිපිය අනුව ඔහුගේ වැටුප් පරිමාණය රු. 28,940.00 ක් ලෙස දක්වා ඇත. ඔහුගේ පත්වීම් දිනය වන්නේ ජූලි මස 12 වන දිනයි. පත්වීම් දිනය දා ම ගිහාන් මහතා සේවයට වර්තා කර ඇත.

i. ගිහාන් මහතාට ජූලි මාසයේදී ලැබිය යුතු මාසික වැටුප කොපමණද? (ලකුණු 03)

ii. වැටුප් වර්ධකයක් ලබාගැනීම සඳහා සම්පූර්ණ කළයුතු අවශ්‍යතා මොනවාද? (ලකුණු 04)

iii. ගිහාන් මහතාගේ රාජකාරි අධීක්ෂණය කිරීමෙන් පසුව ඔහුට ලබාදිය යුතු මීළඟ වැටුප් වර්ධකය තාවකාලිකව අත්හිටුවා ඇත. වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවීම යනු කුමක්ද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. වැටුප් වර්ධකය ගෙවීම අත්හිටුවීමට තීරණය කළ පසුව ආයතන ප්‍රධානියා විසින් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

v. ස්ථිර තනතුරක සේවය කරන නිලධරයෙකු, එම තනතුරට අමතරව තවත් තනතුරක වැඩ බැලීම සඳහා පත්කර ඇත. ඔහුට ගෙවීම් සිදුකළ යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

7. පහත මාතෘකා හතරක් (04) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. මූලික විමර්ශනය

ii. රජයේ නිලධරයෙකුගේ සාමාන්‍ය හැසිරීම

iii. වැටුප් වර්ධක විලම්භනය කිරීම

iv. චෝදනා පත්‍රය

v. දෙවන උපලේඛනය යටතට ගැනෙන වැරදි

(ලකුණු 5X4=20)

**************